# කටාන ප්‍රාදේශීය සභාව.

# ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 **මතය**

මෙම වාර්තාවේ ඇතුලත් මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කටාන ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සභාවේ ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව උසාවි දඩ හා මුද්දර ගාස්තු (අනෙකුත් ආදායම්) මුදල් පදනමට ගිණුම් තබනු ලැබුවද සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු රු.80,000,000 ක් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.2,012,787 ක් සඳහා , රු.1,742,787 ක් පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ආ) 2007 හා 2008 වර්ෂවල ණයහිමි ගිණුමට අය කර තිබූ අවලංගු වූ ව්‍යාපෘතිවල ඇස්තමේන්තු පිරිවැය හා වැඩ අවසන් කර වැය ශීර්ෂ මඟින් ගෙවීම් කර තිබූ හා ගබඩා ණයහිමියන්ට ගෙවා, වැය ශීර්ෂවලට අය කර තිබූ එකතුව

රු.11,798,120 ක් ගබඩා සහ වෙනත් ණයගිම් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(ඈ) වැඩ අවසන් කර ගෙවීම් කර තිබූ ව්‍යාපෘති 78 ක වියදම වූ රු.9,868,320 ක් ණයගිම් ගිණුමට ඇතුළත් කර තිබුණි.

(ඈ) ඉඩම් හා ගොඩනැගිලි වල ගිණුම අනුව වටිනාකම සහ ස්ථාවර වත්කම් ලේඛනය අනුව වටිනාකම අතර, රු.219,927 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ හා කරත්ත වටිනාකම රු.30,259,403 ක් වූ අතර ඊට අදාළ උපලේඛනයේ නිවැරදි එකතුව අනුව මෝටර් රථ හා කරත්ත වටිනාකම රු.29,965,903 ක් වූයෙන් රු.293,500 ක වෙනසක් අනාවරණය විය.

(ඊ) වටිනාකම රු.1,139,162 ක් වූ මෝටර් රථ හා කරත්ත ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(උ) හිඟ හිටි විනෝද බදු සඳහා ලෙජරයේ ගිණුමක් පවත්වා නොතිබුණ බැවින් කටාන උප කාර්යාලයට අදාළව රු.2,487 ක්වූ හිඟ හිටි විනෝද බදු ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නොතිබුණි.

1.3.3 <u>**නොසැසඳු පාලන ගිණුම්**</u>

ගිණුම් විෂයයන් 07 කට අදාළව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.105,116,954 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව එකතුව රු.106,571,711 ක් විය.

1.3.4 <u>**අවිනිශ්චිත ගිණුම්**</u>

වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන රු.37,092 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 <u>**ගෙවිය යුතු ගිණුම්**</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 14,685,681 ක් විය.

1.3.6 <u>**විගණනය සඳහා සාක්ෂි නොවීම**</u>

<u>**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.63,869,152 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.7 <u>නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්</u>

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>නීති, රීති හා රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) <u>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව</u> | |
| (i) 59 රීතිය | යොමුගත රීතිය ප්‍රකාර සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්තිය ප්‍රකාර කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙළ කර එම ලැයිස්තුව සෑම වර්ෂයකම මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 164 රීතිය | අදාල ගිණුම් ලියකියවිලි ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දිනපතා පරීක්ෂා කළ යුතු අතර, එසේ පරීක්ෂා කළ බවට කෙටිසන් තබා සහතික කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) 180 රීතිය | මුදල් භාරකරුවන්, ගබඩා භාරකරු, වවුචර් සහතික කරන හා චෙක්පත් අත්සන් කරන ආදි ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි</u> | |
| අංක 133 හා 134 | සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වා නොතිබුණි. |

2. **<u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵලය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.110,451,062 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 610,280 ක් විය.

2.2 **<u>ආදායම් පරිපාලනය</u>**

**<u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>**

2011 පෙබරවාරි 07 දිනැති මගේ අංක ඩබ්එන්/ප.පා./වි.වා./2011/1 දරන ලිපියට අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා සිටියද එම තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

□

2.3 **<u>වියදම් ව්‍යුහය</u>**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **<u>පුනරාවර්තන වියදම්</u>** | 000 | 000 | 000 | 000 | 000 | 000 |
| පෞද්ගලික පඩිනඩි | 43,469 | 37,352 | 6,117 | 44,795 | 36,735 | 8,060 |
| අනෙකුත් | 41,585 | 67,885 | (26,300) | 38,133 | 51,203 | (13,070) |
| උප එකතුව | 85,054 | 105,237 | (20,183) | 82,928 | 87,938 | (5,010) |
| ප්‍රාග්ධන වියදම | 42,254 | 127,470 | (85,216) | 23,483 | 131,546 | (108,063) |
| මුළු එකතුව | 127,308 | 232,707 | (105,399) | 106,411 | 219,484 | (113,073) |

====== ====== ======= ====== ====== =======

2.4 **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

**<u>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | - |
| ද්විතීයක | 38 | 27 |
| ප්‍රාථමික | 129 | 110 |
| වෙනත් (අනියම් හා තාවකාලික) | 02 | 101 |
| | 170 | 238 |

පලාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා නොගෙන අනියම් කම්කරුවන් 98 දෙනෙකු බඳවා ගෙන වැටුප් ගෙවා තිබුණි.

2.5 **<u>වත්කම් කළමනාකරණය</u>**

2.5.1 **<u>ලැබිය යුතු ගිණුම්</u>**

(අ) 1997 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති සඳහා අඩුවෙන් ප්‍රතිපූර්ණය වී තිබූ රු.2,688,750 ක් ණයගැතියෝ ලෙස ගිණුම් වලට ඇතුළත්වී තිබුණි.

(ආ) පෙර ගෙවුම් ලේඛනය අනුව 2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.3,584,140 ක් වූ අතර, රු.2,705,844 ක ශේෂයක් 2004 වර්ෂයටත් පෙර සිට ඉදිරියට ගෙන එමින් තිබුණි.

2.5.2 **<u>අයවීමට ඇති සේවක ණය</u>**

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.15,393,666 ක් වූ අතර, සේවය හැරයාම, මියයාම වැනි හේතූන් මත දැනට සේවයේ නොමැති නිලධාරින් 16 දෙනෙකුගෙන් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිටි රු.252,796 ක විය.

2.6 **අවිධිමත් ගනුදෙනු**

**ඉතිරි කරගත් නිවාඩු පදනම් කරගෙන නැවත සේවයේ යෙදවීම**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) විශ්‍රාම ලබා සිටි නිලධාරින් දෙදෙනෙක් ඉතිරි කරගෙන තිබූ නිවාඩු මත නැවත සේවයේ යොදවා ගෙන තිබූ අතර, එයින් රද්දොළුගම උපකාර්යාලයේ කාර්යභාර නිලධාරිනිය සේවයේ යෙදවීමට අදාළව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලැබී නොතිබුණි.

(ආ) රද්දොළුගම උප කාර්යාලයේ විශ්‍රාමික කාර්යභාර නිලධාරිනිය අනුමැතිය රහිතව මාස 4 1/2 ක් සේවයේ යොදවා තිබූ අතර, ඒ සඳහා රු.80,811 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) විශ්‍රාමික නිලධාරියෙකු නැවත සේවයේ යෙදවීමේ දී 2007 මැයි 11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2007 හි සඳහන් ප්‍රතිපාදනවලට පටහැනිව රු.47,824 ක් ගෙවා තිබුණි.

2.7 **මතභේදයට තුඩුදෙන ගනුදෙන**

**පහත නිරීක්ෂණයන් කෙරේ.**

(අ) **ගිණුම් සැකසීමේ කටයුතු වෙනුවෙන් ගෙවීම**

සභාවේ ගිණුම් සැකසීමේ කටයුතු වෙනුවෙන් කළමනාකරණ සේවයේ නිලධාරිනියක් යොදවා තිබියදී ඇයගේ සේවය ලබා නොගෙන 2010 පෙබරවාරි 25 දින පැවති මහා සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණයකට අනුව 2009 ගිණුම් පිළියෙල කිරීම සඳහා විශ්‍රාමික නිලධාරිනියකගේ සේවය ලබා ගෙන ඒ සඳහා දිනකට රු.1,000 ක බැගින් දින 24 කට රු.24,000 ක් ගෙවා තිබුණි.

(ආ) **පෞද්ගලික මස්කඩ සඳහා වාර්ෂිකව බදු අය කිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) (xi) හා (xii) උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාව සතු දේපළ කුලියට හෝ බද්දට දිය හැකි වුවද, ඊට පටහැනිව ප්‍රාදේශීය සභාවට අයත් නොවන පෞද්ගලික මස්කඩ පහකින්

රු.370,000 ක වාර්ෂික බදු අයකර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(ඇ) <u>වරිපනම් බදු මෘදුකාංගය නඩත්තු කිරීම සඳහා ගෙවීම් කිරීම</u>

සභාවේ වරිපනම් බදු පරිගණක ගත කිරීම සහ නඩත්තු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.51,000 ක් ගෙවා තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2001 ඔක්තෝබර් 12 දිනැති පළාත් පාලන චක්‍රලේඛ අංක එල්ජී/15/2001 හි 11 ඡේදය අනුව පළාත් පාලන ආයතන වල වරිපනම් බදු පරිගණක ගත කිරීමෙන් පසු අමතර සේවාවන් ලබා ගැනීමෙන් වළකිනු පිණිස කාර්ය මණ්ඩලය සඳහා අංග සම්පූර්ණ පුහුණුවක් ලබා ගත යුතු වේ. ඒ අනුව මෘදුකාංගය සඳහා වාර්ෂික සේවා ගිවිසුමක් පවත්වා ගැනීම අවශ්‍ය නොවන බැවින් මෘදුකාංග සැපයුම්කරුට රු.30,000 ක සේවා ගාස්තුවක් ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය කෙරේ

(ii) ගිවිසුම අනුව චෙක්පත්, ගාල්ල මාදම්පේ ග්ලෝබල් කම්පියුටර් සිස්ටම්ස් ආයතනයට ලිවිය යුතු වුවද, පුද්ගලයෙකුගේ නමට චෙක්පත් ලියා තිබුණි.

(iii) මෘදුකාංග සේවා කිරීම සඳහා ගිවිසුමක් තිබියදී නව ආකෘතියට අනුව සකස් කරන ලද බිල්පත ඇතුළත් මෘදුකාංග ස්ථාපිත කිරීම සහ නව පරිගණකයට මෘදුකාංග ස්ථාපිත කිරීම සඳහා රු.21,000 ක් ගෙවීමට හේතුව පැහැදිලි කර නොතිබුණි.

2.8 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අයවැය පාලනය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය